# කාන්තා පරපුර
# பெண்கள் தலைமுறை
# Women Generation

අංක 83/20, 1 වැනි පටුමග,
සිවලි කැලණිතිලක මාවත,
කොහල්විල, කැලණිය.

0112 777 988 / 0760 975 049
womengeneration.srilanka@gmail.com

එක්සත් ජාතීන්ගේ නේවාසික නිත්‍ය නියෝජිත,
එක්සත් ජාතීන්ගේ කොළඹ කාර්යාලය,
බෞද්ධාලෝක මාවත,
කොළඹ 07.

මඟින්,

එක්සත් ජාතීන්ගේ මහලේකම් තුමා,
එක්සත් ජාතීන්ගේ සංවිධානය,
නිව්යෝක්
ඇමෙරිකා එක්සත් ජනපදය.
ගරු ලේකම්තුමනි,

**ගාසා තීරයේ ජීවත්වන පලස්තීන ජනයාගේ මානව අයිතිවාසිකම් උල්ලංඝනය සහ යුද්ධයෙන් පලස්තීන දරුවන් අනාතභාවයට පත්වීම සම්බන්ධයෙන් වහාම මැදිහත් වන ලෙස කරනු ලබන අවධාරණයයි.**

ඊශ්‍රායල හමුදා සහ හමාස් සංවිධානය අතර ඇතිවී තිබෙන යුධ ගැටුමේ ප්‍රතිඵලයක් ලෙස ගාසා තීරයේ ජීවත්වන ජනයාගේ මානව හිමිකම් බරපතල ලෙස උල්ලංඝනය වෙමින් පවතින බව අප මෙන්ම ඔබ තුමාද හොඳින් දන්නා කාරණයකි. මේ වන විට එම තත්වය මෙම සියවසේ මානවයා මුහුණ දෙන දරුණුතම ඛේදවාචකයක් බවට පත් වෙමින් තිබෙන බව ඔබතුමා වෙත පෙන්වා දීමට කැමැත්තෙමු. එම ඛේදවාචකයේ ප්‍රතිඵලයක් ලෙස දෙමව්පියන් අහිමි වූ දරුවන් දහ හතර දහසක් පමණ වන දරුවන් පිරිසක් ආහාර, ජලය, වෛද්‍ය පහසුකම් සහ ප්‍රමාණවත් ආරක්ෂාවක් නොමැතිව දැඩි අනාතභාවයකට පත්ව තිබෙන බව ලෝක ප්‍රසිද්ධ කරුණකි.

"ලොව හොඳම දේ දරුවන්ටය" යන කියමන විවාදයකින් තොරව පිළිගන්නා ජගත් සංවිධානයක් වන එක්සත් ජාතීන්ගේ සංවිධානයට පලස්තීන දරුවන් මුහුණ දෙන මෙම ඛේදවාචකය මගහැර යා නොහැකි බව අපි අවධාරණය කරමු. ඒ අනුව මෙම තත්වය තව තවත් උග්‍ර වීම වැලැක්වීම සඳහා එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මහ ලේකම්වරයා ලෙස ඔබතුමා පෞද්ගලිකවම මැදිහත් වන ලෙස අපි දැඩි ලෙස ඉල්ලා සිටිමු. මානව ඛේදවාචකයකට මුහුණ දෙන පලස්තීන ජනයා ඉන් මුදවා ගැනීමට ඔබතුමාගේ සෘජු මැදිහත්වීම සිදුවිය යුතු බවද අපි අවධාරණය කරමු.

ඒ අනුව අප සංගමය ඉහත විශේෂයෙන් අවධාරණය කළ පලස්තීන දරුවන් මුහුණ දෙන ඛේදවාචකය අවසන් කිරීමට පහසු වීමට පහත යෝජනා ඔබ තුමා වෙත ඉදිරිපත් කරමු.

1) UNESCO සංවිධානයේ සෘජු මැදිහත් වීමෙන් ඊශ්‍රායල් සහ පලස්තීන යුද්ධයේ ගොදුරු බවට පත් දරුවන්ගේ මානව අයිතිවාසිකම් උල්ලංඝනය වීම් පිලිබඳව නිල වාර්තා කඩිනමින් සකස් කිරීම සහ ඒවා වහාම ජනගත කිරීම.

කාන්තා පරපුර
பெண்கள் தலைமுறை
Women Generation

අංක 83/20, 1 වැනි පටුමග,
සීවලි කැලණිතිලක මාවත,
කොහල්විල, කැලණිය.
0112 777 988 / 0760 975 049
womengeneration.srilanka@gmail.com

2) UNESCO සංවිධානයේ සෘජු මැදිහත්වීම යටතේ මෙම තත්වය පිලිබඳව ජාත්‍යන්තර ප්‍රජාවගේ අවධානය යොමු කරවීම.

3) දරුවන්ගේ ආරක්ෂාව, වෛද්‍ය පහසුකම්, ආහාර සහ අධ්‍යාපනය සපයා දීම වෙනුවෙන් සක්‍රිය වැඩපිළිවෙළක් සකස් කිරීම.

ඒ අනුව UNESCO ආයතනයට අප ඉදිරිපත් කළ ඉහත යෝජනා සැලකිල්ලට ගෙන වහාම කටයුතු කිරීමට බල කර පලස්තීන ජනයගේ සහ එහි වැසියන්ගේ, දරුවන්ගේ ජීවිත සහ ඔවුන්ගේ අනාගතය රැක ගැනීමේ ලෝක ජනයා සතු වගකීම ඉටු කිරීමට පෙරමුණ ගන්නා ලෙස, අපි ගෞරව පූර්වකව ඔබතුමාගෙන් ඉල්ලා සිටිමු.

ස්තුතියි,
මෙයට විශ්වාසී

Udeni wijeweera

උදේනි විජේවීර
කැඳවුම්කරු,
කාන්ත පරපුර,
සීවලි කැලණිතිලක මාවත,
කැලණිය.
2025.05.27